දුවේ පුතේ ....

පහත වාක්‍ය කියවන්න.

| | |
|---|---|
| මල්ලිලා පාසල් ගියෝ ය. | මල්ලිලා පාසල් ගියහ. |
| නංගිලා ගීත ගැයුවෝ ය. | නංගිලා ගීත ගැයූහ. |
| අයියලා පොත් කියෙවුවෝ ය. | අයියලා පොත් කියවූහ. |
| මාමලා ගමට පැමිණියෝ ය. | මාමලා ගමට පැමිණියහ. |
| වෛද්‍යවරු රෝගීන් පරීක්ෂා කළෝ ය. | වෛද්‍යවරු රෝගීන් පරීක්ෂා කළහ. |

"මල්ලිලා පාසල් **ගියෝ ය.**"

"ගියෝය" බහුවචන නාම පදයක් යෙදුණු අතීත කාල වාක්‍යයක්
ක්‍රියා පදය **"ඕය"** ශබ්දයෙන් අවසන් වී ඇති

**මල්ලිලා පාසල් ගියහ.**

නාම පදය පුරුෂලිංග බහුවචන නාම පදයක
ක්‍රියා පදය ලෙස යෙදී ඇත්තේ **'ගියහ'** යනුවෙන්
**එය ද අතීත කාල බහුවචන ක්‍රියා පදයක්**

අතීත කාල බහුවචන ක්‍රියා පදය 'ඕය' ශබ්දයෙන් පමණක් නොව

**ගියහ, ගැයූහ, කියවූහ, පැමිණියහ, පරීක්ෂා කළහ**
යනාදි ලෙස **'හ'** යන්නෙන් ද අවසන් කළ හැකිය.

ඔබත් අතීත කාල වාක්‍ය 10ක් "ඕය" ශබ්දය හා "හ" ශබ්දය අගට එන ලෙස සකස් කරන්න